**බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 134(3)රෙගුලාසිය | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාවක් අභ්‍යන්තර විගණක විසින් අප වෙත එවා නොමැති බව. | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,597,628 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 9,228,410 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,369,218 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් වියදම් රු.8,004,537 කින් වැඩිවීම, පුනරාවර්තන ආදායම් රු. 764,816 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනාවල බටංගල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අක්කර 05 ක ඉඩමක බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය 2016 ඔක්තෝබර් 18 වන දින ස්ථාපිත කර ඇතත් විගණිත දිනය වන 2022 ජනවාරි 28 දින වන විටත් විද්‍යායතනය වෙත එම ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | 2016 වසරේ සිටම පවරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, මේ වන විට පවරා ගැනීම සඳහා අවශ්‍ය මිනුම් කටයුතු අවසන්ව ඇති බව. | විද්‍යායතනය වෙත ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කල යුතුය. |
| (ආ) | 2019 හා 2020 වර්ෂයන්හි පවත්වන ලද විභාග ප්‍රතිඵල පිළිබඳ නියැදි පරීක්ෂාවේදී 2018 කණ්ඩායම NVQ 5/6 S – II හා 2019 පළමුවර විභාගයට පෙනී සිට සමත්වීමේ ප්‍රතිශතය සියයට 50 කට අඩු වූ අවස්ථා පිළිවෙලින් 18 ක් හා 10 ක් වූ අතර අසමත් වීමේ අවස්ථා 16 ක්ද නැවත අයදුම්කර විභාගයට පෙනී සිට සමත්වීමේ ප්‍රතිශතය සියයට 50 ට අඩු වූ අවස්ථා 19 ක්ද පැවතුණි. මේ අනුව විභාග අසමත්වීම, විභාග සඳහා පෙනී නොසිටීම හා විභාගය නිසි පරිදි සම්පූර්ණ නොකිරීම සම්බන්ධයෙන් කළමනාකරණයේ නිසි අවධානය යොමු වී නොතිබුණි. | 2018 ශිෂ්‍ය කණ්ඩායමට අදාලව NVQ 5/6 හි පළමු වන සමාසිකයෙහි අවසන් වාර පරීක්ෂණය නිසි පරිදි සැලසුම් කර තිබියදී ශිෂ්‍ය කණ්ඩායම් විසින් විභාගය වර්ජනය කිරීම හේතුවෙන් එම කණ්ඩායමට නැවත විභාගය සඳහා පෙනී සිටීමට සිදු වූයේ ඊළඟ වාරයේ බැවින් මෙම තත්ත්වය උදා වී ඇති බව. | විභාග අසමත්වීම් හා විභාගවලට පෙනී නොසිටීම් සම්බන්ධයෙන් සොයාබලා ඊට විසඳුම් ලබාදීමට කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා සිසුන් අයදුම්කිරීම, සිසුන් බඳවාගැනීම, සිසුන් විශ්වවිද්‍යාල විද්‍යායතනය හැරයාම හා අදාල පාඨමාලා සම්පූර්ණ කිරීම පිළිබඳ පරීක්ෂාවේදී සිසුන් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාඨමාලා සඳහා අයදුම් කිරීමේ ප්‍රගතිය 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය සඳහා සියයට 15 කින් පහත වැටීමක් සිදු වී තිබුණි. සිද්ධි කළමනාකරණය, ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය, සංචාරක හා සංචාර කළමනාකරණය යන පාඨමාලා සඳහා සිසුන් ඉල්ලුම් කිරීමේ ප්‍රගතිය 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී පිළිවෙලින් සියයට 27, සියයට 32 හා සියයට 43 ක් ලෙස අඩු වී තිබුණි. 2017 හා 2018 කණ්ඩායම් එම පාඨමාලා සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය සියයට 65ක හා සියයට 54ක මට්ටම්වල පැවතුණි. ඒ අනුව විද්‍යායතනයේ මූලික අරමුණ වූ රටට ඩිප්ලෝමාධාරීන් බිහිකිරීමේ ප්‍රතිශතය අඩු වී තිබුණි. | රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සිසුන් අයදුම් කිරීමේ ප්‍රතිශතය අඩු වීමත් විශේෂයෙන් සිද්ධි කළමනාකරණය සහ සංචාරක හා සංචාර කළමනාකරණය යන පාඨමාලා සඳහා අයදුම් කිරීමේ ප්‍රගතිය සංචාරක කර්මාන්තයේ පහත වැටීමත් නිසා සිදු වී ඇති බව. | විද්‍යායතනයේ පාඨමාලා සම්බන්ධයෙන් පුළුල් දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් උපරිම ධාරිතාවයෙන් යුතුව සිසුන් බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | පාඨමාලාවන්ට අදාල ඇතැම් විෂයයන් (Module) සම්බන්ධයෙන් තෝරාගත් විෂයයන් 57 ක නියැදියකට අදාලව ආවරණය කිරීමට සැලසුම් කල දේශන පැය ප්‍රමාණයට සාපේක්ෂව සම්පූර්ණ කරන ලද පැය ප්‍රමාණය සැසඳීමේදී සියයට 4 සිට සියයට 50 දක්වා මට්ටමක පැවති අවස්ථා 39ක් විය. මේ හේතුවෙන් සිසුන්ට ලැබෙන විෂය දැනුමේ ප්‍රමාණාත්මකභාවය හා විෂයමාලාවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉගැන්වීමේදී භෞතිකව සිදු කරනු ලබන පැය 1½ ක කාලය පැයක කාලයට සමාන වේ. එසේ සලකා බලන විට මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලද පැය ප්‍රමාණය මෙහි දක්වා ඇති ප්‍රමාණයට වඩා වෙනස් බව. | සිසුන්ට වැඩි දායකත්වයක් ලැබෙන ලෙස දේශන පැය සැලසුම් කිරීමට කටයුතු කල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනයේ ආගන්තුක සත්කාර කළමනාකරණ අංශයේ සිසුන්ගේ පුහුණුවීම් කටයුතු සඳහා අත්‍යාවශ්‍ය අංශයක් වන නාන කාමරයක් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල ඉදිකිරීම සඳහා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් රු.464,400 ක් වටිනා නාන කාමර උපාංග 2015 අගෝස්තු 24 දින ලබාදී තිබුණි. එහෙත් විගණිත දිනය වන 2023 පෙබරවාරි 08 දින වන විටත් අවුරුදු 08 කට ආසන්න කාලයක් ගත වී තිබුණද නාන කාමරයක් ඉදිකිරීමට කටයුතු නොකිරීමෙන් එම උපකරණ කාමරයක් තුල නිෂ්කාර්යව පැවතුණි. එසේම සිසුන්ට ඒ සම්බන්ධ පුහුණුවීම් | ආගන්තුක සත්කාර කළමනාකරණ විද්‍යාගාරයේ නාන කාමරයක් ඉදිකිරීම සඳහා මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතින අතර මේ වසර තුල සිදුකර නිම කිරීමට නියමිත බව. | වත්කම් උපරිම කාර්යක්ෂමතාව යෙන් හා ඵලදායීව අරමුණුගත කාර්ය සඳහා යොදාගත යුතුය. |

කටයුතු සඳහා වෙනත් ස්ථාන වෙත යොමු කිරීමට සිදු වී තිබුණි.

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත එකතු වටිනාකම රු.5,398,645 ක් වූ සත්කාරක කළමනාකරණය හා පර්යේෂණාගාර පුළුල් කිරීම හා ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය හා වැඩහල් ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2021 ජූලි 20 දින ලැබී තිබූ නමුත් එම ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා 2021 අගෝස්තු 03 වන දින සිට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලද අතර ඒ එක් එක් ව්‍යාපෘති සඳහා මිල කැඳවුම බැගින් ලැබුණ නමුත් ලද සියළුම මිල කැඳවුම් ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 30 ඉක්මවා තිබීම හේතුවෙන් මෙම ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවීමට උපදෙස් ලබාදෙන ලද බව. | ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කථිකාචාර්යවරුන් බඳවාගැනීමේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ කර නොතිබූ කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි. | කෝවිඩ් වසංගත තත්ත්වය පිළිබඳ සලකා බලා 2021 ඔක්තෝබර් 27 දින පැවති 110 වන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පාලන මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයක් මත සිදුකර ඇති බව. | බඳවාගැනීම් පරිපාටිය අනුව බඳවාගැනීම් සිදුකල යුතුය. |